
# ශුද්ධවූ පැය



විශ්වාස ලක්ෂණය
ස්වර්ගයේ වැඩසිටින
නමෝ මරිය
*පිතා පුත්‍රයා...*

## ආරම්භක යාච්ඤාව

අහෝ මාගේ අමෘතබරවු ජේසුනි, මාගේ එකම ප්‍රේමයෙනි ! අපගේ පාප වලින් සහ නොසැලකිම් වලින්ද ඔබගේ ශ්‍රී හෘදයට දෙන්නාවූ, දුක් කණගාටු වලින් පිරි සුසුම්ලමින් 'මා සමග දුක් ශෝකවිමට යමෙකු බලා සිටියෙමි. එහෙත් කිසිවෙක් නොසිටියේය. මා සනසන්නෙකු සෙව්වමි. එහෙත් කිසිවෙක් සම්භනුනේය'යි (ගීතා 69:20) ඔබ වහන්සේ වදාළසේක් වේද? ඔබගේ මේ කන්නලව්ව අසා මාගේ හෘදය ශෝකයෙන් දැල්වී, මාගේ ප්‍රේමයෙන්, සත්ප්‍රසාදයෙහි රෑ දවල් දෙකෙහිම වැඩ සිටින්නාවු ඔබවහන්සේගේ දයාබර දිව්‍ය හෘදයට සැනසිම දෙන්ට ආශාවෙමි.

අනේ මාගේ දුක්බරිත ජේසුනි, ඔබගේ මේ දුක් ශෝකයට හේතුව මාගේ ගණන් නැති පව් වන්නේ වේද? නමුත් මගේ පෙම්බර ජේසුනි, මාගේ පාපවලට කෝප නොවි ඔබ මා උදෙසා වින්දාවු දුක් ප්‍රාප්තිය සිහිකර, දයාවන්ත පියාණෝ ඔහුගේ නාස්තිකාර පුත්‍රයා භාරගත්තාක් මෙන් (ශු. ලුක් 15:20-21) මා වෙත කරුණා බැල්ම ලා වදාළ මැනව. පාපිෂ්ඨ මරිය මග්දලේනා කෙරෙහි කරුණාවෙන් බලා 'නුඹේ පව් නුඹට ක්ෂමා වුවාය' (ශු. ලුක් 7:48) වදළාක් මෙන් මාගේ පාපවලුත් මට ක්ෂමාවුව මැනව. අනේ මාගේ පෙම්බර ජේසුනි, ඔබගේ දිව්‍ය හෘදයේ ප්‍රේම දුවණිය වන මාර්ගරිතා මරියතුමිට 'මාගේ හෘදයට සැනසිලිදයක බිලිපඩුරක් සොයන්නෙමි මම නුඹ තෝරා ගත්තෙමි'යි වදළාක් මෙන් අසරණ පවුකාර වු මාත් ඔබවහන්සේට සැනසිමක් කොට ඔබ දිව්‍ය හෘදයට බාරගත මැනව. එලෙස ජිවිතය පසුකිරිමට මට වරප්‍රසාද දුන මැනව. ඔබගේ දිව්‍ය ප්‍රේමයෙන් මාගේ හෘදය දැල්වුව මැනව.

*(සියල්ලෝම) ජේසු තුමන්ගේ මධුර වු හෘදයෙනි, මාගේ ප්‍රේමය වුව මැනව.*

(300 දවස් පුර්ණඵලයි)

මාගේ පෙම්බර ජේසුනි, මාගේ පාපවලට මන්ස්ථාපවී ඔබ කෙරෙහි ප්‍රේමයෙන් දැල්වී ඔබගේ ආදරණිය දුවනියගෙන් ඉල්ලු ප්‍රකාර ඔබ මල් උයනේදි වින්දවු කධුර දුක් ගාවිනාවලට පංගුකාරයෙක් විමටද, 'ඔබට සැනසීම දිමටද, මමත් මේ පැයේදි ඔබ සමග මල් උයනේදි ඔබ කලාවු යාච්ඤාවට සහ වින්දවු දුකටද එකඟ විමට මට වරම් දුන මැනව, මා බාරගත මැනව, මට ආශිර්වාද කළ මැනව.

අහෝ වික්ෂෝප මෑණියෙනි, ඔබ ප්‍රිය පුත්‍රවු ජේසුස් ස්වාමි දරුවෝ මල් උයනේදි තනිව මරණය දක්වා දුකින් සිටන විට උන්වහන්සේ සැනසිලි වචනයක්වත් කියන්නට නොහැකිව, ඔබ වින්දවු දුක්සාගරය සිහිකර මේ පැයේදි මාගේ හෘදය ඔබගේ වික්ෂෝප හෘදයට එකඟකර, ඔබ සමග අඩා වැලපි, ඔබගේ ප්‍රේමයට මාගේ ප්‍රේමය එකගකර, උන්වහන්සේට සැනසිම දෙන්ට මට පිහිටවුව මැනව.

දයාධික මනස්ථාපනය

මාගේ දෙවියනි ! මම ඔබ වහන්සේට අනදර කළ නිසා බෝහෝ සේ වික්ෂෝප වෙමි, මාගේ පාපවලින් සදාකලික නිරා ගින්නට හිමි වූ හෙයින්ද, මාගේ දයාබර ජේසුස් ක්‍රිස්තුස් ස්වාමිදරුවන් උදෙසා කුරුසියේ ඇණ ගැසූ හෙයින්ද,

විශේෂ කොට සර්ව දයා යහපත්කම් ඇත්තා වූ ඔබට අනදර කළ හෙයින්ද, සියළු දේට වඩා ඒවාට වෛර කරමි, මා කළ සියළු පාප වලට මාගේ මුළු හෘදයෙන්ම ක්‍ෂමාව ඉල්ලමි, ඔබ වහන්සේගේ පිහිටෙන් මින් මතු පව් නොකර සිටින්නටත්, පාප අවස්ථා වලින් වැළකී සිටින්නටත් ඒකාන්තයෙන් පොරොන්දු වෙමි. ආමෙන්.

ප්‍ර : ක්ෂමාවුව මැනව. ස්වාමිනි, ඔබගේ ජනයාට ක්ෂමා වුව මැනව.

උ : සදාකාලයටම අප කෙරෙහි කෝප නොවෙනවා සොඳේ

---

## පළමුවෙනි පැයකාල

"මා මැරෙන තරම් මාගේ ආත්මය ශෝකයෙන් පිඩිත වන්නේය."

(ශු. මතෙව් 26:38)

අහෝ පෙම්බර ජේසුනි, ඔබ අප කෙරෙහි තිබෙන මහත් ප්‍රේමය නිසා අප සමග ලෝකාන්තිමය දක්වා වාසය කරන පිණිසද, අප ආත්මික භෝජනය කොටද, අප හෘද ඔබ ප්‍රේමයෙන් දල්වන පිණිසද ශුද්ධවූ සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළ සේක.

ඉන් පසු එම රාත්‍රියේදීම අප පාපයෙන් සහ යක්ෂයාගේ වහල්කමින් ගලවාගන්නා පිණිස මල් උයනට වැඩම කොට මුහුණින් වැටී ඔබම බිලි පඩුරක් කොට ඔප්පු දුන් සේක.

අහෝ ! මාගේ ආත්මයෙනි පාපයේ ද්‍රෝහීකම මෙයින් තේරුම්ගන්නට පුළුවන. ජේසු ස්වාමිදරුවෝ අපගේ සියලු පාපවලට වන්දි ගෙවීම පිණිස ඒ සියල්ලම උන්වහන්සේ පිටම පවරා ගත් සේක. එකල්හි පාපවල පිළිකුල්කම් සහ අපිරිසිදුකම් වලින් අශික්ෂිත කුෂ්ඨ රෝගයකින් වැසී සිටින දේව ද්‍රෝහියෙක් මෙන් භයානක දුක් කණගාටු වලට පත්වූ සේක. එකල්හි දැරිය නොහැකි දුක් ශෝකයෙන් උන්වහන්සේ මුහුණින් වැටී මා මැරෙන තරම් මාගේ ආත්මය ශෝකයෙන් පීඩිත වන්නේය' යි (ශු. මතෙව් 26 : 38) වදාරණ සේක. එය උසුලාගන්නට බැරිවාක් මෙන් 'උන්වහන්සේගේ ඩාදිය පොළොවෙහි ලේ බිංදු මෙන් ගලා ගියේය. (ලූක් 22/44) ජේසුස් ස්වාමිදරුවෝ මේ වින්දාවූ දුක් ගැන ශුද්ධවූ මර්ගරිතා මරියතුමීට මෙසේ වදාළ සේක. 'පාපයේ ද්‍රෝහිකම සහ පිළිකුල්කම ද මනුෂ්‍යයා නොදන්නා බැවින් මම මල් උයනේදී වින්දාවූ දුක ඔහුට තේරුම් ගන්නට බැරිවිය.

එපමණක් නොව මෙපමණ කධුරවූ දුක් ගාවිනා වින්දායින් පසුත් සදාකාලික නරකාදියට යන්නාවූ මනුෂ්‍ය රාශිය තවත් දුක් ශෝකයට පත්වී වඩ වඩා යාච්ඤා කළ සේක. (ලූක් 22 : 43)

අනේ ! සර්වදායාබරවූ ජේසූනී ! අප පාපවල් ඔබ පිට පවරාගෙන ඊට වන්දි ගෙවීමට කුරුසියේ එල්ලී සිටිද්දී ඔබ පියාණන්ගේ රෞද්‍ර බැල්ම ඉවසන්ට බැරිව 'මාගේ දෙවියනී, මාගේ දෙවියනී, ඔබ මා අත්හැරියේ මන්දැයි කියා මොරගැසුවෙහි නම්, (මතෙව් 27 : 46) පාපයෙහි ගිලී මරණාසන්නව සිටින්නන්ට එය කොපමණ භයන්කර වේද?

ප්‍ර : ජේසුස් ස්වාමිදරුවන්ගේ මරණාසන්නව සිටි හෘදයෙනි.
උ : මරණාසන්නව සිටින්නන්ට කරුණා කළ මැනව.

අහෝ මාගේ ආත්මයෙනි, මා කෙරේහි මෙපමණ ප්‍රේමය පෙන්වන්නාවූ දෙවියන් වහන්සේට විරුද්ධව කෙසේ පව් කෙලෙම්ද? නීච ලෙස සහ නැවත නැවතත් කොපමණ වාරයක් පව් කලෙම්ද? අනේ ජේසුනී, මට ක්ෂමා වුව මැනව. ඔබ වහන්සේගේ පිහිටෙන් මින්මතු පාපයක් නොකරන්නට පොරොන්දු වෙමි.

වික්ෂෝප මාතාවෙනි, මාගේ පෙම්බර මෑණියනී, මට පිහිට වුව මැනව.

## ජේසුස් ස්වාමිදරුවන්ගේ දුක්ප්‍රාප්තියේ විලාපය

*(කැමති නම් මේ වෙනුවට මෙහි අග උෟණපූරණයෙහි සඳහන් යාච්ඤාවක් කිය හැකිය)*

1. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කලෙම්ද? කුමකින් තට මම පිඩා කලෙම්ද? මට උත්තර දෙව?

එජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැලවුම්කාරයාණන්ට කුරුසියක් ජෝඩු කෙළෙහිය.

1. අහෝ ශුද්ධවූ දෙවියන් වහන්ස
   I. අහෝ ශුද්ධවූ දෙවියන් වහන්ස,

1. අහෝ ශුද්ධවූ ශක්ති සම්පන්නයාණනී වහන්ස,
   I. අහෝ ශක්ති සම්පන්නයාණෙනි,

1. අහෝ ශුද්ධවූ අමරණීයාණන් වහන්ස,
   අපට කරුණා කළ මැනව.
   I. අහෝ ශුද්ධවූ අමරණීයාණන් වහන්ස,
   අපට කරුණා කළ මැනව.

සතලිස් අවුරුද්දක් මුළුල්ලේ කාන්තාරයෙන් තා ගෙන ගොස් මන්නා බොජුන් කවා ඉතා යහපත් දේශයකට තා පැමිණෙව් නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කළෙහිය.

1. අහෝ ශුද්ධවූ දෙවියන් වහන්ස
   I. අහෝ ශුද්ධවූ දෙවියන් වහන්ස,

1. අහෝ ශුද්ධවූ ශක්ති සම්පන්නයාණනී වහන්ස,
   I. අහෝ ශක්ති සම්පන්නයාණෙනි,

1. අහෝ ශුද්ධවූ අමරණීයාණන් වහන්ස,
   අපට කරුණා කළ මැනව.
   I. අහෝ ශුද්ධවූ අමරණීයාණන් වහන්ස,
   අපට කරුණා කළ මැනව.

1. මා විසින් කරන්නට ඕනෑ දෙයින් කුමක් නොකර හැරියෙම්ද? මාගේ ඉතා රුව ඇති මිදි වත්ත තට වවා දුනිමි. එහෙත් මාගේ පිපාසයේදී තෝ මට කාඩි බොන්නට දුන්න බැවින් තෝ මට ඉතා තිත්ත වුනෙහිය. හෙල්ලයකින් තගේ ගැළවුම්කාරයාගේ ඇලය සිදුරු කලෙහිය.

1. අහෝ ශුද්ධවූ දෙවියන් වහන්ස
    I. අහෝ ශුද්ධවූ දෙවියන් වහන්ස,

1. අහෝ ශුද්ධවූ ශක්ති සම්පන්නයාණනී වහන්ස,
    I. අහෝ ශක්ති සම්පන්නයාණෙනි,

1. අහෝ ශුද්ධවූ අමරණීයාණන් වහන්ස,
   අපට කරුණා කළ මැනව.
    I. අහෝ ශුද්ධවූ අමරණීයාණන් වහන්ස,
       අපට කරුණා කළ මැනව.

1. තා නිසා එජිප්තුවේ කුළුදුලන්ට පහර දුනිමි. එහෙත් තෝ මට පහරදී මා පාවා දුන්නෙහි.

    II. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කලෙම් ද? කුමකින් තට මම පීඩා කලෙම් ද? මට උත්තර දෙව?

එජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.

2. පාරාවොන් රතු මුහුදෙහි ගිල්වා තා එජිප්තුවෙන් පිටතට මම ගෙනාමි. එහෙත් තෝ මා නායක පුජකයින්ට අල්ලා දුන්නෙහිය.

    II. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කලෙම් ද? කුමකින් තට මම පීඩා කලෙම් ද? මට උත්තර දෙව?

එජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.

3. තා ඉදිරියෙහි මුහුද ඇරියෙමි. එහෙත් තෝ හෙල්ලයකින් මාගේ ඇලය ඇරියෙහිය.

    II. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කලෙම් ද? කුමකින් තට මම පීඩා කලෙම් ද? මට උත්තර දෙව?

එජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.

4. තට පෙරටුව මේඝ ටැඹකින් මම ගියෙමි. එහෙත් තෝ මා පිළාත්තුගේ නඩු ශාලාවට ගෙන ගියෙහිය.

    II. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කලෙම් ද? කුමකින් තට මම පීඩා කලෙම් ද? මට උත්තර දෙව?

එජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.

5. කාන්තාරයේදී මන්නා බොජුනෙන් මම තා පෝෂ්‍ය කෙළෙමි. එහෙත් තෝ මට බැට දුන්නෙහිය.

    II. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කලෙම් ද? කුමකින් තට මම පීඩා කලෙම් ද? මට උත්තර දෙව?

ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.

6. පර්වතයෙන් ගැළවීමේ වතුර මම තට පෙවීමි. එහෙත් තෝ මට තිත්තත් කාඩිත් දුන්නෙහිය.

II. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කලෙම් ද? කුමකින් තට මම පීඩා කලෙම් ද? මට උත්තර දෙව?

ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.

7. තා නිසා කානානීය රජුන්ට මම පහර දුනිමි. එහෙත් තෝ මාගේ සිරසට බට දණ්ඩකින් ගැසුවෙහිය.

II. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කලෙම් ද? කුමකින් තට මම පීඩා කලෙම් ද? මට උත්තර දෙව?

ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.

8. මම තට රාජකීය ඔටුන්නක් දුනිමි. එහෙත් තෝ මගේ හිසට කටු ඔටුන්නක් දුන්නෙහිය.

II. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කලෙම් ද? කුමකින් තට මම පීඩා කලෙම් ද? මට උත්තර දෙව?

ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.

9. මහත් බලයෙන් මම තා උසස් කෙළෙමි. එහෙත් තෝ මා කුරුසිය නම් එල්ලුම් ගහේ එල්ලුවෙහිය.

II. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කලෙම් ද? කුමකින් තට මම පීඩා කලෙම් ද? මට උත්තර දෙව?

ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.

Ana – ස්වාමිනී අපි ඔබගේ කුරුසියට නමස්කාර කරමු. ඔබගේ ශුද්ධවූ නැවත නැගිටීමට ස්තූති ප්‍රශංසා කරමු. කුමක් හෙයින්ද නම් මුළු ලෝකෙට මේදන්ඩෙන් ප්‍රීතිය පැමුණුන සෙයින.

Ps – දෙවියෝ අපට කරුණාකොට ආශිර්වාද කරන සේක්වා ! උන්වහන්සේගේ ශ්‍රී වත එලිය අප පිට බබලන සේක්වා!

(*සියල්ලෝම*) ස්වාමිනී අපි ඔබගේ කුරුසියට නමස්කාර කරමු. ඔබගේ ශුද්ධවූ නැවත නැගිටීමට ස්තූති ප්‍රශංසා කරමු. කුමක් හෙයින්ද නම් මුළු ලෝකයටම මේ දණ්ඩෙන් ප්‍රීතිය පැමුණුන සෙයින.

ජේසුනි ලෝකයන් කෙරෙහි

ජේසුනි, ලෝකයන් කෙරෙ හි
බොහෝ සේ දයා වුයෙ හි
දුෂ්ටයන්ගේ කුරිරු සිත් හි
පාප දෙස් දුරු කෙළෙ හි

කරුණා සාගරයෙනි - ක්ෂමා වුව මැනව
ජේසුනි මාගේ දෙවියනී - කරුණාකළ මැනව

ඔබගේ පාද පද්මයේ හි
සිටිමු අපි ශෝක ව
පාපි වු දසයන් කෙරෙ හි
උදහස් නුන මැන ව
දිව්‍ය ජේසුස් මේ ලෝකයෙහි හි
සියල්ලන් වෙත ප්‍රේමයේ න්
වද වින්දේ කුරුසියෙ හි
අපෙ පාප නිමිත්තයෙ න්

---

## දෙවැනි පැයකාල

''පියාණෙනී, මේ දුක් පාත්‍රය මාගෙන් අහක්විය හැකි නම් එසේ වේවා.
නමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ අභිප්‍රාය සිදුවේවා.''

(ලුක් 22:42)

අනේ පෙම්බර ජේසුනී මනුෂ්‍යයාගේ උඩගුවෙන් සහ අකීකරු කමින් පාපය පැමිණුන බැවින්, ඔබගේ බැගෑපත් කීකරු කමින් ඊට වන්දි ගෙවිමට සහ එයින් අප මුදාගන්නටද කරුණා අභිප්‍රා කළ සේක් වේද? ඔබගේ ශ්‍රී ශරිරයෙන් ලේ ඩහදිය වැගිරි ඔබගේ හෘදය දුකෙන් පොඩිවී, වෙව්ලමින් බියපත්වී, ''මාගේ ආත්මය මැරෙන තරම් ශෝකයෙන් පීඩිතවී, පියාණෙනි, මේ දුක් ප්‍රාප්තිය මාගෙන් අහක්විය හැකිනම් එසේ වේවා'යි වදාළ සේක්වේද?

ඔබගේ මනුෂ්‍ය ස්වභාවයට භයානක කඨුරවු දුක් වේදනා පමුණුවා, ගනිමින් ඔබ බැගැපත් ලෙස සෂ්ඨාංගයෙන් වැඳවැටි සිටින විට, මෙම දුක් ප්‍රාතය සතුටින් වැළඳ ගත් සේක්වේද !

අහෝ මාගේ ආත්මයෙනි, අපේ සියලු දුක් කණගාටුවලදි, ජේසුස් ස්වාමිදරුවෝ අප කෙරෙහි පෙන්වන්නාවු ප්‍රේමය බලා, මෙපමණ අපට ප්‍රේම ඇත්තාවු දෙවියෝ, අපේ යම් යහපතකට හැර අයහපතක් හෝ යම් දුකක් හෝ, අපට පැමිණෙන්නට ඉඩනාරින බව විශ්වාස කරමු. ජේසුස් ස්වාමිදරුවෝ අප උදෙසා වින්දාවු දුක් සිහිකර, අපේ වේදනා උන්වහන්සේගේ දුක් ප්‍රාප්තියට එකතු කරමු. උන්වහන්සේ මල් උයනේදි යාච්ඤා කළාක් මෙන් උන්වහන්සේ සමග අපිත් යාච්ඤා කරමු. ''මාගේ පියාණෙනි, මෙම දුක් ප්‍රාප්තිය මාගෙන් අහක්විය හැකිනම් එසේ වේවා, එහෙත් මාගේ කැමැත්ත ලෙස නොව ඔබවහන්සේගේ කැමැත්ත ලෙස සිදුවේවා.... මාගේ පියාණෙනි, මෙම ප්‍රාත්‍රය පානය කිරිමෙන් මිස එය මාගෙන් අහක් නොවේ නම්, ඔබවහන්සේගේ අභිප්‍රායම සිදුවේවා.''

(මතෙව් 26:39-42)

අනේ මාගේ මෑණියෙනි, ඔබ දිව්‍ය කුමාරයාණන්ගේ ශ්‍රී රුධීරයෙන්, මාගේ සියලු පාපවල් දෝවනය කල මැනව. උන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය උදෙසා සියලු පාප පරික්ෂා වලින් මා ගලවා ගත මැනව, උන්වහන්සේගේ මහිමතාවයෙන් මා පළඳවනු ඇත. ඔබගේ ගුණධර්මවලින් මා සැරසුව මැනව. ඔබගේ ශ්‍රී හස්තවලට මා රැගෙන අනේ වික්ෂෝප මෑණියෙනි, මාගේ ජිවිතය උන්වහන්සේගේ අභිප්‍රාය සැටියට පසුකරන්නට මට පිහිටවී, මා පෙම්බර ජේසු තුමන්ගේ දිව්‍ය හෘදයට ප්‍රසන්න බිලිපඩුරක් මෙන් මා ඔප්පු කළ මැනව.

යහපත් මරණයක් ලැබිමට යාච්ඥාව

ජේසු ස්වාමිදරුවනි, යහපත නැමැති දෙවියනි, කරුණාව නැමැති පියාණෙනි, ලැජ්ජාවුනාවු බැහැපත් තැවුණු සිතින් ඔබ වහන්සේට මා අභිමුඛව, මාගේ අන්තිම වේලාව සහ ඊට පසු ලංවෙන්නාවු දෙයත් ඔබ වහන්සේට බාර කරමි.

මාගේ පා සොලවන්නට බැරිවීමෙන් මාගේ මෙලොව ජිවිතයේ අන්තිමය ලංවන බව දක්වන කල්හි, අනේ ! සර්වදයාබරිතවු ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

මාගේ වෙව්ලන අත්බරා බැරිවී, කුරුසිය ප්‍රතිමාව තදින් අල්ලා ගන්නට බැරිවී, මාගේ වේදනාව නැමැති ඇඳ උඩ අකමැත්තෙන් වැටෙන්නට අරින කල්හි, අනේ ! සර්වදයාබරිතවු ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

මාගේ ඇස්දෙකම අඳුරුවී, ලංවන මරණයට භයවී, ඔබ දෙසට හැරී බලන කල්හි, අනේ ! සර්වදයාබරිතවු ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.
මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

මාගේ කම්මුල් සුදුමැලිවී නිල්වී, ලග සිටින්නන් අනුකම්පා බියපත් කරවන කල්හි, මගේ හිසකෙස් ඇල්ඩහදියෙන් කෙලින්වී මාගේ අන්තිමය ලංවුන බව දක්වන කල්හි, අනේ ! සර්වදයාබරිත ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

මාගේ කන්දෙක මනුෂ්‍යයිනගේ කථාවලට නිරන්තරයෙන්ම බිහිරිවෙන්නට ආසන්නවී, සදා කාලයටම වෙනස්කල නොහැකි වු තින්දුව කියන්නාවු ඔබගේ හඬ ශබ්දය අසන්නට නමා තිබෙන කල්හි, අනේ ! සර්වදයාබරිතවු ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කල මැනව.

මාගේ සිත භයානක විහිලු ඡායා වලින් කැළඹී, මරණීයවු ශෝකයෙහි ගිලි තිබෙන කල්හිත්, මාගේ ආත්මයද මාගේ නපුරුකම් දැක්මෙන් සහ ඔබගේ නිතියට බියෙනුත් චංචලවී, ඔබගේ කරුණා සැනසීමේ දර්ශණය මගෙන් දුරුකොට, මා ප්‍රාර්ථනා නැතිකමට අසුකරන්නට වෑයම් කරන්නාවු අන්ධකාරයේ දූතයා සමග පොර අල්ලන කල්හි, අනේ ! සර්වදයාබරිතවු ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

මාගේ දුර්වලවූ හෘදය රෝග වේදනාවලින් පීඩිතවී, මරණයේ භීතවලින් ගැස්සි, මාගේ ගැළවිමේ සතුරන්ට විරුද්ධව කළ වැයම්වලින් කොඩත්තු වේගෙන යන කල්හි අනේ ! සර්වදයාබරිතවූ ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

මාගේ ජිවිතය අන්තිමය වන බව දක්වන්නාවූ මරණාසන්න කදුළු වගුරන කල්හි පශ්චත්තාප විලක් මෙන් මා මැරියන පිණිස, ඔබවහන්සේ මාගේ පව් ගෙවීමේ පුජාවක් කොට එය පිලිගෙන, අනේ ! සර්වදයාබරිතවූ ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

මට සිහිය නැතිවීමෙන් මුළු ලෝකය නොපෙනි ගොස් මා මරණ වේදනා වලින් කෙදිරිගාන කල්හි, අනේ ! සර්වදයාබරිතවූ ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

මාගේ හෘදයේ අන්තිම සුසුම්ලැම් වලින් මාගේ ආත්මය මේ කයෙන් පිටත්ව වෙන්ට දගලන කල්හි, ඔබ වහන්සේ වෙතට එන්න මාගේ ආශාවේ ලකුණක් කොට ඒවා පිළිගෙන, අනේ ! සර්වදයාබරිතවූ ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

ශිතලවූද, පණ නැතිවූද, මේ ශරීරයෙන් මාගේ ආත්මය පිටත්වී, මෙලොවින් සදාකාලයටම තුරන්දුවෙන කල්හි, මාගේ ජිවිතය නැති විමෙන් ඔබට මම කරන නමස්කාරයක් මෙන් ඒ පිලිගෙන, අනේ ! සර්වදයාබරිතවූ ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

මාගේ බන්ධු මිත්‍රයන් මාගේ යහන් වටේ සිටිමින්, මා වෙත දයාවෙන් කදුළු වගුරා මා උදෙසා යාච්ඤා කරන කල්හි, අනේ ! සර්වදයාබරිතවූ ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

හදිස්සියෙන් හෝ නොදැනුවත්ව වත් මට මරණය පැමුණුනත් මාගේ එම භයානක මොහොතේදි, පමා නොවි, දෙවියනි, මාගේ ආධාරයට වැඩිය මැනව. ස්වාමිනි, මට පිහිට වෙන පිණිස කඩිනම් කළ මැනව. අනේ ! සර්වදයාබරිතවූ ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

අන්තිමකොට මාගේ ආත්මය ඔබ වහන්සේට අභිමුඛවී, ඔබ වහන්සේගේ මහෝත්තම කමේ අමරණියවූ දීප්තිය ප්‍රථම වතාවට දකින කල්හි, අනේ මා ඔබ වහන්සේගේ සම්මුඛයෙන් නොපන්නා ඔබට සදාකාලයටම වන්දනා කරන පිණිස ඔබගේ කරුණාව නැමැති සෙනෙහෙවන්තවූ ශ්‍රී කුමාරයාට මා එක්වෙන්න සැලැස්වුව මැනව, අනේ ! සර්වදයාබරිතවූ ජේසුනි, මා ගැන අනුකම්පා වුව මැනව.

මාගේ ජේසුනි, මට කරුණා කළ මැනව.

**යාච්ඤා කරම්හ**

අහෝ ! මාගේ දෙවියනි, ඔබ වහන්සේ අපේ මරණ දින, පැය, වේලාව රහස්කර අප මරණ අච්චුවට පත් කලා වේද ! ඒ නිසා සාධාරනකමෙන් හා ශුද්ධකමෙනුත් අපේ ජීවිත සැම දිනවලම පසුකර, යහපත් හෘදය සාක්ෂියේ සමාදානයෙන් මෙලොවින් තුරන්දු වෙන්නටත්, ඔබගේ ප්‍රේමය ඇතුව මැරෙන්නටත්, අප හේතු කාරයන් වන ලෙස වරම් දෙනවා සොඳේ.

මේ කිඳේ ඔබ ප්‍රිය පුත්‍රවු ජේසු ස්වාමිදරුවන්ගේ ශුද්ධවු දුක්ප්‍රාප්තිය උදෙසාද, උන්වහන්සේගේ දිව්‍ය රුධිරය සහ ශ්‍රී වණ කැළැල් උදෙසාද, උන්වහන්සේ මල් උයනේදි වින්දාවු මරණාසන්න දුක් සහ කුරුසියෙහි උකුත්වීම උදෙසාද, අපට ලැබෙන මෙන් ජේසු ස්වාමිදරුවන්ගේ ශ්‍රී නාමයෙන් සහ උන්වහන්සේ සමගද ඉල්ලා සිටිමු. ආමෙන් !

## සුමිහිරි ජේසු ආසිරි දෙවා

සුමිහිරි ජේසු ආසිරි දෙ වා
වදන් ඔබේ අප සිත්හි පිහිටු වා
හද අපේ දෙව් ප්‍රේමයෙන් දල් වා
මේ සියල්ල යනු පෙර දෙ වා

කෝරස් :

ජේසු අපේ ආලෝකය වේ
දැනුත් මරණ වේලෙහි

පැය ගෙවී නිමව දව සා
ඔබ සියල් බැලුවෙ විම සා
ලැබු කුසල් දෙව් වරම් නි සා
අගුණ පාප වැරදි බ සා

පවිටු මාර්ග හැර සුව සේ
සමිඳු දේ දිව් යවන සේ
නිමල බව හද සතො සේ
දෙනු මැනේ පෙරට වැඩි සේ

# තුන්වැනි පැයකාල

''මා සමග එක පැයක්වත් පිබිද සිටින්නට නුඹලාට බැරි උනාද?''

(මතෙව් 26:40)

අහෝ මාගේ ආත්මයෙනි ! ජේසු ස්වාමිදරුවෝ උන්වහන්සේගේ ප්‍රිය දියණියට සුසුම්ලා වදාළ කන්නලව්වට ඇහුම්කන් දෙනු.

මාගේ මුළු දුක්ප්‍රාප්තියෙන් වින්දවු ශාරීරික වේදනා වලට වඩා මල් උයනේදි මා හෘදය තුල දුක් වින්දෙමි..... මනුෂ්‍යයින්ගේ පාප මා කෙරෙහි ගෙන, දේව ශුද්ධත්වය ඉදිරිපිට මම සිටියෙමි. උන්වහන්සේද මාගේ නිදොස්කම නොසලකා, තමන්වහන්සේගේ කෝපය මා පිට පමුණුවා උන්වහන්සේගේ සාදාරණ විනිෂ්චයෙන් නියමවු කඨුර කසට සහ තිත්ත ප්‍රාතය පානය කරන්නට මට නියම කල සේක. මා වින්දවු අධික දුක් වේදනාව යම් මනුෂ්‍යයෙකුට තේරුම් ගන්නට නොහැකිය.

අහෝ මේ ඉසිලිය නොහැකි දුක් ශෝකයේදි, උන්වහන්සේ තෝරා ගත් මිත්‍රයන් වන ගෝලයන් වෙත තුන්වරක් හැරි ආ සේක ! එවිට ඔවුන් උන්වහන්සේ ගැන කල්පනාවක්වත්, උන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය ගැන කිසි අනුකම්පාවක් නැති ආකාරයෙන් නිදා ඉන්නා දැක උන්වහන්සේ කොපමණ දුක් කණගාටුවට පත්වු සේක්ද කිවහොත්, 'මාගේ අපෝස්තුළුවරුන් විසින් ඒ පැයේදි මා අත්හැරිමෙන් දුක් ශෝකයට පැමිණ 'මා සමග පැයක්වත් පිබිද සිටින්නට නුඹලාට බැරිද'යි අවවාද කිරිමට පවා හේතුවු දුකට මෙම ශුද්ධවු පැයේ භක්තියෙන් සැනසිම දෙන පිණිස උන්වහන්සේ මාර්ගරිතා මරිය තුමියගෙන් ඉල්ලු සේක.

(සියල්ලෝම) 'ජේසුනි, ඔබ උදෙසා ජිවත් වෙමි. ජේසුනි, ඔබ උදෙසා නසින්නෙමි. ජේසුනි, ජිවිතයේහිදි ද, මරණයේහිදි ද, මම ඔබ වහන්සේගේ වෙමි...

(100 දවස් පූර්ණ එල)

අහෝ ! මාගේ ජේසුනි, මල් උයනේදි ඔවුන් නිදා ඉන්නා දැක ඔබ මෙපමණ ශෝකයට පැමුණුනු සේක් නම් ඔබ අප උදෙසා සත්ප්‍රසාදයෙහි රෑ දවල් දෙකේහිම සිරකාරයෙක් මෙන් සිටිමින්, මනුෂ්‍යයන්ගෙන් ලබන්නාවු නොසැලකිම් සහ අවමානද ද්‍රෝහිකම් ද ඔබගේ දිව්‍ය හෘදයට කොපමණ ශෝක හටගන්නා කරුණු වේද?

''මනුෂ්‍යන්ට මෙපමණ ප්‍රේම කළාවු හෘදය බලනු.... ඊට සැලකිමක් වශයෙන් මනුෂ්‍යයන් වැඩි කොටසෙන් මට ලැබෙන්නේ මේ මාගේ ප්‍රේමයේ ප්‍රසාද නිධානය කෙරෙහි ඔවුන් දක්වන ඇල්මැරුණු ගතියෙන් සහ අපහාස කිරිමෙන් පෙන්වන්නාවු නොසැලකිම් සහ දේව ද්‍රෝහිකම වේ. මාගේ දුක්ප්‍රාප්තියේදි විනදවු සියලු දුක් ගාවිනාවලට වඩා මේ කරුණු මට වඩා දුක් සහිත වන්නේ, ඔවුන් යම් .... ස්වල්ප වශයෙන්වත් මාගේ ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දෙන්නේ නම්.... ඔවුන් උදෙසා හැකිනම් තවත් වඩා දුක් ගාවිනා විදින්නට මම ආශාවෙමි'යි ඔබවහන්සේ වදාළ සේක් වේද?

අනේ මාගේ පෙම්බර ජේසුනි, යම් විටක යාච්ඤා කිරිමට හෝ දේව මෙහෙයෙහි කොයියම් කාරණාවකදි, හෝ ඒ නොසැලකිමට යම් පරික්ෂාවක් හට ගත්තොත් ඔබ වහන්සේ දුක් ශෝකයෙන් පිරි 'මා සමග එක පැයක්වත් පිබිද සිටින්නට නුඹලාට බැරිවුනාදැ'යි (මතෙව් 26:40) වදාළවු කන්නලව්ව සිහිකර, ඔබ වහන්සේව තව වඩා ප්‍රේමයෙන් ජ්වලිතව අදහා ගැනිමට මට පිහිට වුව මැනව.

අහෝ මාගේ අමෘතබර වූ ජේසුනි, මින්මතු මම කොතැන්හිදිත්, රාත්‍රියේ පිබිදෙන වෙලාවේදිත්, මා උදෙසා සත්ප්‍රසාදයෙහි වැඩ සිටින්නාවූ ඔබ නිතර සිහිකර ඔබට මාගේ ආදරය ඔප්පු කරන්නටත්, ඔබ ආත්මීක වශයෙන් මාගේ හෘදය තුළට කැඳවා ගන්නටත්, දේවස්ථානය ඉදිරිපිටින් යන විට ඔබ සිහිකර ඔබට ගෞරව කරන්නටත් පහසු තිබෙන සැටියට දේවස්ථානයට ඇතුල්වූ ඔබට සුලු යාච්ඤාවක් ඔප්පු කරන්නටත්, නිතර නිතර ඔබවහන්සේ සත්ප්‍රසාද මාර්ගයෙන් මා හෘදය තුළට ලබා ගන්නටත් මට පිහිටාශිර්වාදය කළ මැනව.

## ප්‍රතිකාර ප්‍රර්ථනාව

ආ ජේසුස් ස්වාමිදරුවනි ! දිව්‍ය ගැලවුම් කාරයාණෙනි ! ඔබ දිව්‍ය හෘදයේ බිලිපඩුරක් වන ඔබ වහන්සේගේ දරුවන් පිට කරුනා බැල්මලා වදාරණවා සොඳේ. එවුහු විශ්වාසයේත් ප්‍රතිකාරයේත්, ප්‍රේමයේ එකම සිත් අභිප්‍රායෙන් එකමුතු වී තමුන්ගේද කාලකණ්නි සියලු පව්කාරයින්ගේද, අවිශ්වාසවන්තකම ගැන දුක්මනස්ථාපනයෙන් ගැවී සිටිති. අප විසින් කරන්නට යන එක්සිත්වූද, ප්‍රසිද්ධවූද, වාක්දත වලින් ඔබවහන්සේගේ දිව්‍ය හෘදය දයානුකම්පා වී අපටද, ලෝකයාටද, ඔබවහන්සේට ප්‍රේම නොවන අවසනාවන්ත වූ සියල්ලන්ටද ඔබට ප්‍රේම වන්නට කරුණාව ලැබේවා.

මින්මත්තට අප සියල්ලෝ වාක්දතයක් දෙමු.

එනම් :- ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

මනුෂ්‍යයන්ගේ මතක නැතිකමත් කෙලෙහි ගුණ නැතිකමත් උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

දිව්‍ය සත්ප්‍රසාද මන්ඩපයෙහි ඔබවහන්සේ ප්‍රතික්ෂේප කරනු ලැබිම උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

පව්කාරයන්ගේ අපරාධ උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

අභක්තිවුවන්ගේ වෛරය උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේට කියන ලද අපහාස වචන උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ දේව්කයට කරන ලද අනදර උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ ප්‍රේමයේ ප්‍රසාද නිධානය දුශ්‍ය කරන ද්‍රොහිකම් උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ දිව්‍ය සම්මුඛයෙහි සිද්දකරන ලද අගෞරවාචාරයන්, අවමානයත් උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

වන්දනීය වූ බිලිපූජාවක් වන ඔබවහන්සේට කරන ලද තද අනදර උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ දරුවන්ගෙන් මහත් කොටසක් දක්වන අලසකම උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ ප්‍රේමවන්ත අවවාද සුලුකිරීම් උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ මිත්‍රයෝය කියමින් මග හරින ඔවුන්ගේ අවිශ්වාසය උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ වරප්‍රසාද නිරර්ථක තිරීම උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සෙට ප්‍රේම කිරිමට අපගේ දිර්ඝ ප්‍රමාද කිරිම උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ දේව මෙහෙයෙහි අපේ ඇල්මැරුණු ගතිය උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ආත්මය විනාශ වෙන නිමිත්තෙන් ඔබවහන්සේගේ තිත්ත දුක්කනගාටු උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේ අපේ හෘද ද්වාරය ළග ආසාවෙන් බලා වැඩ සිටිම උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ සිත වේදනා කරවන දුෂ්ඨ හෙළාදැකිම් උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ ප්‍රේමවන්ත සුසුම්ලෑම් උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ ප්‍රේමවන්ත කඳුලු උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ ප්‍රේමවන්ත සිරගතවීම් උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

ඔබවහන්සේගේ ප්‍රේමවන්ත උකුත්වීම් උදෙසා,

ස්වාමිනි, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

## යාච්ඤා කරම්හ

ජේසු ස්වාමිදරුවනි, දිව්‍ය ගැලවුම් කාරයාණෙනි, ඔබවහන්සේගේ දිව්‍ය හෘදයෙන්ම දුඃඛිත වූ මැසිවිල්ල නික්මුණේය. එනම්: ''මා සනසන්නෙකු බලා සිටි නමුත් කිසිවෙක් සම්භනුනේය.'' අපි ඔබවහන්සේට ඔප්පුකර සිටින විට සුලු සැනසිම කරුණාවෙන් පිළිගත මැනව. මින්මතු ඔබවහන්සේට අප්‍රසන්න සියල්ලෙන් වැඩි වැඩියේ අහක්වී යන්නටත්, සියල්ලෙහි ද සෑම තැන්හිදි සහ සදකල්හීත් අපි ඔබවහන්සේගේ දිව්‍ය හෘදයේ අති විශ්වාසවන්තවුද, ජ්වලිත භක්තිවුද, දරුවන් බව ප්‍රකාශ කරන සැටියට ඔබවහන්සේ වරප්‍රසාද අපට දෙනවා සොඳේ. එකම දෙවි වූ පියාණන් වහන්සේ සමඟද, ස්ප්‍රිතු සාන්තුවහන්සේ සමඟද, සදකාලයටම ජිවත්වන්නාවූ, රජකම් කරන්නාවුද, ඔබවහන්සේගේ දිව්‍ය හෘදය බලා එසේ ලැබෙන මෙන් උදක්ම ඉල්ලා සිටිමු ආමෙන්.

මා ප්‍රේමවූ දිව්‍ය හෘදයෙනි

මා ප්‍රේමවූ දිව්‍ය හෘදයෙනි
දේව දයාවේ ලාංජනයෙනි
සර්වප්‍රසාද නිධානයෙනි
අනන්ත ජීවිත උල්පතෙනි

කෝරස්

ආ ජේසුනි, මා ජේසුනි, ඔබගේ ශ්‍රි හෘදයෙන්
කරුණා බරව අපගේ පාපයෙන් මුදනු මැනව.

මෝක්ෂ හැර ඔබ අප නිසා
පක්ෂයෙන් මේ ලෝකයෙහි බැස්සා
යක්ෂයන්ගේ වික්‍රමයන් නසා
දුක්ෂ වින්දේ දාසයන් උදෙසා

අප නිසාම ඔබ කුරුසේ
උකුත් බව නොදන්නා විලසේ
ඔබේ දයාව සැම දවසේ
හෙළා දකින්නෙමු අගුණසේ

---

# සතරවෙනි පැයකාල

''මනුෂ්‍ය කුමාරයා පව්කාරයන් අතට අසුවන වේලාව පැමිණුනේය. මෙතැනින් නැගිට යම්හ''

(මතෙව් 26:46)

මාගේ අමෘතබරවූ ජේසුනි, අප විසින් පාප ප්‍රස්ථාවල් සොයමින් කැමැත්තෙන්ම පාපයට වැටෙන නිසා ඊට ප්‍රතිකාර වශයෙන් ඔබ පාවා දෙන්නට එන්නාවූ ජුදාස් සහ ඔබට මෙපමණ දුක් දී කුරුසියේ ඇන ගැසිමට පවා ලැස්තිව සිටින්නාවූ ජුදයින් වෙතද ඔබවහන්සේම මෙපමණ ප්‍රිතියෙන් යන සේක් වේද?

අනේ මාගේ මධුරවූ ජේසුනි, යම් පාප පරික්ෂාවක් හෝ පාපිෂ්ඨඅශාවක් මා තුළ හටගන්නාවිට, එය කොපමණ සුලු පාපයක් වූ නමුත්, එම පාපයට බිලිපඩුරක් මෙන් මෙපමණ දුක් විද කුරුසියෙහි ඔප්පු වුනාවූ සහ ලෝකාන්තිමය වන තුරු සත්ප්‍රසාදයෙහි සිට ඔප්පුවෙන්නාවූ, ඔබගේ දුක්ප්‍රාප්තිය සිහිකරන්නට මට පිහිට වුව මැනව. මෙම සත්ප්‍රසාදයෙහි

සිට ඔප්පුවෙන්නාවූ, ඔබගේ දුක්ප්‍රාප්තිය සිහිකරන්නට මට පිහිට වුව මැනව. මෙම සත්ප්‍රසාදයෙහි වාසය කරමින් මුලු ලෝකයේම සියල්ලන් විසින් කරන්නාවූ සියලු පාපවල් ඔබ දකිනා බවද මම කල්පනා කර! ''මනුෂ්‍ය කුමාරයාණෝ පව්කාරයන් අතට අසුවෙන වේලාව පැමුණුනේය. මෙතැනින් නැගිට යම්හ'යි යන ඔබවහන්සේගෙ කන්නලව්ව ඉල්ලීමට ඇහුම්කන් දීමට මට ආශිර්වාද කළ මැනව.

ඔබවහන්සේ මා සමග සිටින බව සිහිකර, ඔබවහන්සේ කෙරෙහි මා විශ්වාසය තබා ඔබවහන්සේ සමග එම පාප පරික්ෂාව අත්හැර දැමීමට මට වරප්‍රසාද දුන මැනව. ''අපි එනම්, ජේසුස් ස්වාමිදරුවෝ මා සමගද, මම උන්වහන්සේ සමගද, අපි ''මෙතැනින් '' එනම්, මෙම පාප පරික්ෂාව දුරුකර නැගිට යම්හ'' සැබැවින්ම මා ශක්තිමත් කරන්නාවූ තැනැන්වහන්සේ තුළ මට සියල්ල කරන්නට පුලුවන්.

(පිලිප්පි 4:13)

(සියල්ලෝම) සුපිරිශුද්ධ පරම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට සෑම මොහොතවලදිම ස්තූති ප්‍රශංසා කරනු ලබන සේක්වා.

(දවස් 100 පූර්ණඑල)

අහෝ මාගේ ආත්මයෙනි, අපි යම් විටෙක යම්පාපයකට වැටි හෝ යම් පාප පරික්ෂාවක යෙදි සිටින්නෙමු නම් උන්වහන්සේගේ ශු. පේදුරු තුමන්ගේ මෙන් අපේ හෘදවල් ද පශ්චාත්තාප ප්‍රේමයෙන් දැල්විමට අප වෙතත් බලන සේක. උන්වහන්සේගේ මේ කරුණා බැල්ම නොසලකා අපි සිටන්නෙමු නම් ජුදස්ට කිවාක් මෙන් ඉතා දයනුකම්පාවෙන් ''මිත්‍රය, නුඹ කුමකට පැමිණියෙහිද (මතෙව් 26:50) 'ජුදස්, නුඹ සිඹීමින් මනුෂ්‍ය පුත්‍රයාණන් පාවා දෙන්නෙදැ'යි (ලූක් 22:48) අපටත් කියන සේක.

අප පෙම්බර ජේසු ස්වාමිදරුවෝ පිතාවන දෙවියන් ඉදිරියෙහි, මල් උයනේදි හා කුරුසගසේදි මෙන්, දැනුත් ස්වර්ගයෙහි සහ සත්ප්‍රසාදයෙහි ද වැඩ සිට අප ශාරිරික දුර්වලකම් පියාණන් වහන්සේට පෙන්වා දෙන සේක. ''ආත්මය කැමති එහෙත් ශරීරය දුර්වලය'' තවද අප පාපයෙන් රෞද්‍රකම නොදැන පාපයට වැටෙන බව කියා 'පියාණෙනි, මොවුන් කරන වරද නොදැන කරන සෙයින් මොවුන්ට ක්ෂමා වුව මැනව'යි උන්වහන්සේ අප උදෙසා යාච්ඤා කරන සේක.

''යක්ෂ පරික්ෂාවලට අස්නොවන ලෙස සැලකිමෙන් සිට යාච්ඤා කරපල්ලායැ'යි අපට අවවාදකර, අප සහොදර ප්‍රේමයෙන් මෙලොව එකමුතුකර, දේව ත්‍රිත්වයට සදකාලයටම අප එකග කරගන්නා පිණිස මෙසේ යාච්ඤා කරන සේක. ''ශුද්ධවූ පියාණෙනි, ඔබ වහන්සේ මට භාරකලාවූ ඔවුන් ඔබවහන්සේගේ නාමයෙන් රක්ෂා කළ මැනව. ඔවුන් සියල්ල ඒකත්වයෙන් සිටින පිණිස පියාණෙනි, ඔබ මා තුළද මා ඔබ තුළද සිටින්නාක් මෙන්, ඔවුන්ද අප තුළ එකග කළ මැනව.''

(ජොහාන් 17:11-21)

(සියල්ලෝම) අනේ පෙම්බර ජේසුනි, අපෙන් සියලු ආකාර කෝප, ද්‍රෝහි සිත් දුරුකර : අපේ සතුරන්ට ක්ෂමාකර, ඔබ උදෙසා සියල්ලන් සමග ප්‍රේමයෙන් සිටින්නට අපට පිහිට වුව මැනව. ඔබ දිව්‍ය හෘදය තුළ අප එකග කර ගත මැනව.

## ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයට ප්‍රාර්ථනාව

ස්වාමිනි කරුණා කළ මැනව.

ක්‍රිස්තුනි කරුණා කළ මැනව.

ස්වාමිනි කරුණා කළ මැනව.

ක්‍රිස්තුනි අපේ ප්‍රාර්ථනා අසා වදාළ මැනව.

ක්‍රිස්තුනි අපේ ප්‍රාර්ථනා ගිවිස වදාළ මැනව.

පරමණ්ඩල වැඩ හිඳින පිතාවන දෙවියනි.

ලෝකය නිදහස් කළාවූ පුත්‍රවූ දෙවියනි,

ස්ප්‍රිතු සාන්තුවන දෙවියනි,

සුපිරිශුද්ධ ත්‍රිත්වය වූ ඒක දෙවියනි,

1. නිත්‍ය පිතාවන්ගේ පුත්‍රවන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
2. කන්‍යා මාතාවන්ගේ ගර්භයෙහි ස්ප්‍රිතු සාන්තු විසින් සාදන ලද්දවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
3. දෙවියන්ගේ වචන තුමාණන්ට භාවර්ථයෙන් ඒකාබද්ධවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
4. අප්‍රමාණ තේජස හරිතවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
5. දෙවියන්ගේ සුවිසුද්ධ මන්දිරය වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
6. සවෝත්තමයාණන්ගේ මණ්ඩපය වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
7. දෙවියන්ගේ ගෘහය සහ පරමණ්ඩල වාසල වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
8. ප්‍රේමයෙන් දැල්වෙන උදුනවන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
9. ධර්මිෂ්ඨකමෙත් ප්‍රේමයේත් නිධානය වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
10. ධයා යහපත් කමින්ද, දේව ප්‍රේමයෙන්ද පූර්ණවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
11. සියලු ධමගුණයන්ගේ සාගරය වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
12. සකල ප්‍රශංසාවලට යෝග්‍යවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
13. සමස්ත හෘදයන්ගේ රජාණෝද, මධ්‍යස්ථානයද වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
14. ප්‍රඥාවන්ත කමෙත්, දැනගැන්මෙත් සියළු නිධාන අන්තර්ගතවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
15. දේවිකයේ සව් සම්පූර්ණකම වාසය කරන්නාවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
16. පියාණන්ට අති ප්‍රිය ප්‍රසන්න වුණාවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
17. ඔබගේ සම්පූර්ණකමින් අප සියල්ලන් පොහොසත් කරන්නාවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
18. සදාකාලින පව්තවල අභිමතාර්තය වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
19. ඉවසිල්ල සහ අති මහත් දයාව ඇත්තාවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
20. ඔබට යාච්ඤා කරන සමස්තයන්ට ත්‍යාගිවන්තවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
21. ජීවිතයෙත්, ශුද්ධවන්තකමෙත් උල්පත වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
22. අපේ පව් උදෙසා බිලි පූජාවක් වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
23. තද අවමාන වලින් පිරුණාවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
24. අපේ අපරාධ නිසා පොඩි කරන ලද්දවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
25. මරණය දක්වා කීකරු වුනාවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
26. හෙල්ලයකින් සිදුරු කරන ලද්දවූ ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
27. සියලු සැනසීමේ උල්පත වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
28. අපේ ජීවිතයත් උත්ථානයත් වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
29. අපේ සමාදනයත් නැවත මිත්‍ර වීමත් වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,

අපට කරුණා කළ මැනව

30.පව්කාරයන්ගේ බිලිපඩුරක් වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
31.ඔබ කෙරෙහි බලාපොරොත්තු වෙන්නන්ගේ රක්ෂණය වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
32.ඔබ කෙරෙහි නසින්නන්ගේ බලාපොරොත්තුව වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
33.සමස්ථ ශුද්ධවන්තයනගේ ආනන්දය වන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයෙනි,
ලෝක පාපවල් හරින දේව අජබාලකවු ජේසුනි,
අපට ක්ෂමා කළ මැනව. ජේසුනි,
ලෝක පාපවල් හරින දේව අජබාලකවු ජේසුනි,
අපේ ප්‍රාර්ථනා අසා වදාළ මැනව. ජේසුනි,
ලෝක පාපවල් හරින දේව අජබාලකවු ජේසුනි,
අපට දයා කළ මැනව. ජේසුනි,
ප්‍ර : හෘදයෙන් ශාන්ත දන්තවුද, බැහැපත්වුද ජේසුනි,
උ : අපේ හෘදයන් ඔබගේ හෘදයට සමාන කළ මැනව.

## යාච්ඤා කරම්හ

සවිල්ලහවු සදකාලින දෙවියනි, ඔබගේ අති ප්‍රේමනිය පුත්‍රයාණන්ගේ දිව්‍ය හෘදයද, උන්වහන්සේ පව්කාරයන් නමින් ඔබට පිදුවාවු ප්‍රශංසාද, පාපවලට වන්දි වශයෙන් කරන කෘත්‍යන්ද බලා, ඔබගේ කරුණාව අයදින්නාවු අය දෙස ඔබගේ දයා බැල්මලා ඔවුන්ට ක්ෂමාව දුන මැනව.

මෙකී දේ ඔබ හා ස්ප්‍රින්තු සාන්තු සමග එකම දෙවියන් වැඩ සිටින්නාවුද රජකම් කරන්නාවුද, ඔබගේ එකම පුත්‍රවන ජේසු ක්‍රිස්තුස් තුමන්ගේ නාමයෙන් ලැබේවා, ආමෙන්.

## මුළු ලෝකය ජේසු තුමන්ගේ දිව්‍ය හෘදයට කැපකිරීමේ යාච්ඤාව

අති අමෘතබරවු ජේසුනි ! මනුෂ්‍ය ජාතින්ගේ ගැලවුම්කාරයාණෙනි, ඔබගේ පූජාසනය හමුවේ බැගෑපත්ව වැඳ වටී සිටින අප වෙත දයා බැල්මලා වදාළ මැනව. අපි ඔබට අයිති වෙමු. සෑම කලිහිත් අපි ඔබට අයිතිවෙන්ට කැමැත්තෙමු. තවද ඔබ හා සමග වඩා ස්ථිරව එකග වෙන පිණිස අද දිනදී ස්වකීය කැමැත්තෙන්ම අපෙන් එක එකා ඔබගේ දිව්‍ය හෘදයට තම තමා කැප කරයි.

(කැමති නම් මේ වෙනුවට 25 වෙනි පිටේ පෙන්වන්නාවු ''ජේසුස්වාමිදරුවන්ගේ දිව්‍ය හෘදයට ප්‍රතිකාර ආරාධනාව'' ඔප්පු කරනු)

බොහෝ ජනයෝ කවරකලකවත් ඔබ ඇඳින නොගත්තෝය. බොහෝ දෙනාද ඔබගේ පණත් හෙළා දැක ඔබ ප්‍රතික්ෂේප කළෝය. අති දයාබර ජේසුනි ! ඔවුන් සමස්තයට ඔබ දයානුකම්පාවී ඔබගේ දිව්‍ය හෘදය කරා ඔවුන් ගෙන්වා වදාළ මැනව.

ස්වාමිනි, කොයිකලකදිවත් ඔබගෙන් ඉවත්ව නොගිය විශ්වාසකයින්ට පමනකුත් නොව, ඔබට පිටුපා ගිය අකීකරු දරුවන්ටත් ඔබ රජාණන් වන සේකවා. ඔවුන් කාලකණ්නි කමින්ද, සාගින්නෙන්ද විනාෂ නොවන සැටියට සිවකිය දෙව්පියාණන්ගේ ගෘහයට වහාම නැවත හැරී එන මෙන් කරුණා කළ මැනව.

වැරදි මත වලින් රවටනු ලැබු නොහොත් ස්වකිය ඇල්ම වලින් මුලාවී ගියවුන්ටත් ඔබ රජාණන් වන සේක්වා ! එකම බැටළු රැලක්ද, එකම එඬේරෙක්ද වෙන සැටියට සත්‍යතාවයේ විශ්වාස ඒකත්වයෙත් වරායට ඔවුන් ගෙන්වුව මැනව.

ස්වාමිනි ! ඔබගේ ශුද්ධවු සභාවට ස්ථිරවුද, බාධා නැතිවුද, නිදහස දුන මැනව. සියලු දේශ ජනයන්ට නිසි ක්‍රමය හා සමාදානය දෙවා වදාළ මැනව. මේ ලෝකයේ සීමාවෙන් සීමාවට

සෑම තැන්හි අපට ගැලවීම සම්පාදනය කළ දිව්‍ය හෘදයට ප්‍රශංසා ලැබේවා. උන්වහන්සේ මහිමයත් ගෞරවයත් සදාකල් ලැබේවායි සමස්තයෝ එකම ශබ්දයෙන් කියත්වා. ආමෙන්.

### කුරුසේ නැග අත් විහිදා

කුරුසේ නැග අත් විහිදා
මුළු ලෝ තුරුලට වඩලා
සිටිනා දෙවි පුත් රදුණෝ
ඔබෙ පා සිඹිමින් වඳිමු

සිරසේ කිරුළේ මිණි සේ
බැබැළේ බිඳු වැල් සිරි ලේ
කුරුසේ සිටිනා දෙවිඳේ
ඔබෙ පා සිඹිමින් වඳිමු

ඔබ හා කුරුසේ නැගලා
ඔබෙ දෑසින් ලොව බලලා
ඔබ සේ කරුණා පාලා
කුරුසේ හිඳිනා සමිඳේ

හිඳිනා ලෙස මා කැඳවා
කල්වාරිය මත නංවා
ඔබ හා මා හා සිටිමු
කුරුසේ හිඳිනා සමිඳේ

## අවසාන යාච්ඤාව

මාගේ පෙම්බර ජේසුනි ! ඔබ සමග මේ පැයේදි අඬා වැලපි දුක් ශෝකයෙන් පිරී සිටින්නාවූ ඔබගේ දිව්‍ය හෘදයට සැනසිම දීමට ඔබ මා භාරගත් හෙයින්, මාගේ මුලු හෘදයෙන් ඔබට ස්තූතිකර මාගේ ප්‍රේමය ඔබට ඔප්පු කරමි.

අනේ මාගේ ජේසුනි ! ඔබවහන්සේගේ දුක්ප්‍රාප්තිය ගැන මාගේ හෘදය තුළ නිතර සිහිකර, සත්ප්‍රසාදයෙහි වැඩ සිටින්නාවූ ඔබ සමග එකගව දෙවියන් වහන්සේ විසින්ම මට දෙන්ට යෙදෙන්නාවූ සැප සහ දුක්ද, ලෝක සුව සැප වස්තු මනාදිය හා රෝග පීඩාදිය සියල්ලම ඔබවහන්සේට ස්තුති භාර ගැනිමට මට වරම් දුන මැනව. ඔබ සමග ප්‍රීතියෙන් ඒ සියල්ල දරමින් මාගේ මුලු ජිවිතය ඔබ කෙරෙහි ප්‍රේමයෙන් පසුකරන්නට මට පිහිට වුව මැනව.

මාගේ පෙම්බර ජේසුනි ! ඔබවහන්සේගේ පිහිටාශිර්වාදයෙන් මේ පැයේදි, ඔබ මල් උයනේදි මරණාසන්නව වින්දවූ දුකට සහ සත්ප්‍රසාදයෙහිදි ඔබ ලබන්නාවූ දුක් අවමාන වලටද, මම දෙන්නාවූ  සැනසිම උදෙසා මා කෙරෙහි කරුණා බැල්මලා මාගේ ඉල්ලිමට ඇහුම්කන් දුන මැනව. එනම්....

(මෙහි නුඹලාට උවමනා විශේෂ පිහිට උපකාර, විශ්වාස ඒකාන්තයෙන්ම ඉල්ලනු. නුඹලා විසින් මෙම පැයේදි උන්වහන්සේට ඔප්පු කළාවූ සැනසීම උදෙසා උන්වහන්සේ ශ්‍රී හෘදය නුඹලා කෙරෙහි අධික ප්‍රේමයෙන් දැල්වි, නුඹලාට දෙන්ට ඉතා ආදරයෙන් සිටින සේක.)

තවද අනේ ජේසුනි, අයහපත් සහ සදී මරණයෙන් මා ගළවා ගත මැනව.

මම මේ පැයේදී ඔබවහන්සේ සමග සිට ඔබවහන්සේට මාගේ ප්‍රේමය සහ සැනසීම ඔප්පු කරන්නාක් මෙන්, මාගේ මරණාසන්න මොහොතේදීඔබ මා සමග සිට මා සැනසුව මැනව. සත්ප්‍රසාද මාර්ගයෙන්ද ඔබ මා හෘදය තුළට වඩවාගෙන කුරුසියෙහි උකුත්වුනාවු ඔබ සමග, ''පියාණෙනි, මාගේ ආත්මය ඔබවහන්සේගේ ශ්‍රී හස්ත වලට භාරකරමි'යි කියා මාගේ ප්‍රාණය ඔප්පු කිරිමට මට පිහිට වුව මැනව. ''මාගේ ජේසුනි, මම ඔබට ආදරේ වෙමි'යි කියමින් ඔබගේ දිව්‍ය හෘදයට එකමුතු වීමට මට පිහිටාශිර්වාදය කළ මැනව. ඔබගේ ශ්‍රී මුඛයෙන් ''අද දින නුඹ මා සමග ස්වර්ගයෙහි සිටින්නෙහිය'යි යන වාක්‍ය අසන්නට මා වාසනා කාරයෙක් වන ලෙස, ඔබගේ ප්‍රසාද උපකාර මට දෙවා වදාළ මැනව.

වික්ෂෝප මාතාවෙනි, මාගේ පෙම්බර මෑණියෙනි, ඔබ ප්‍රේම පුත්‍රයා මල් උයනේදී ඔබවහන්සේගෙන් වෙන්ව් මරණාසන්නව සිටින විට, උන්වහන්සේට යම් සැනසීමක් දිමට නොහැකිව සිටිය බැවින් ඔබවහන්සේගේ හෘදය තුළ හටගත්තාවු ශෝකය සිහිකර, මාගේ මරණාසන්නයේදී මා අත්හැරිය මැනව. උන්වහන්සේ කුරුසියේ එල්ලි උකුත්වුන විට, උන්වහන්සේ ලඟ සිට, උන්වහන්සේගේ මෘත ශරීරය ඔබ ශ්‍රී හස්ත වලට ගත්තාක් ඔබ මාද තුරුල්කරගෙන, මෙම භයානක මොහොතේදී මගෙන් යක්ෂයා සහ උගේ පරික්ෂාත් දුරුකර, මාගේ සැනසීමද, මාගේ ගැලවීමද, වුව මැනව. ආමෙන්.

### දයා ප්‍රේමය

දයා ප්‍රේමය ඇති තැන
දෙවියෝ වැඩ වසනු ඇත
ක්‍රිස්තු තුමන්ගේ ප්‍රේමයෙන් අපි සැමදෙන එක් වෙමු
එතුමන් තුල ප්‍රීතියෙන් සතුටු වන්නෙමු
ජීවමාන දෙවිතුමනට හද බැති පෙම් දක්වමු
අවංක වු හෘදයෙන් එකින් එකාට ප්‍රේම කරමු

දයා ප්‍රේමය ඇති තැන
දෙවියෝ වැඩ වසනු ඇත
අපි කිසියම් තැනකට එක්රැස්වී සිටිමුද
එක්සිත් වී සිටිනට ප්‍රවේසම් වෙමු
සන්ඩු දඹර නඩු හඹ නොව සාමයෙන් ජීවත්වෙමු
කිතු සමිදාණන් නිතින් අප වෙතටම කැඳවා ගනිමු



දයා ප්‍රේමය ඇති තැන
දෙවියෝ වැඩ වසනු ඇත
මොක් වැසියන් සමගින ඔබෙ තේජස දකිනට
කිතු සමිඳුනි අප හට වරය ලැබේවා
තවද කිසිදු අඩුවක් නැති සදා සැපත අප ලැබ
සදත කල් සගසැප මොක්පුරයේ අප විදිමුය

දයා ප්‍රේමය ඇති තැන
දෙවියෝ වැඩ වසනු ඇත

-නිමි-